**ද්විතියික සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය -2013**

**----------------------------------------------------**

ද්විතියික සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජසංස) අතර 2013 අගෝස්තු 19 දින එළඹී අංක 5228-එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මූල්‍ය ගිවිසුමට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය (සෞ.අමා.) ජාතික මට්ටමින් හා පෙර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ  රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය පළාත් මට්ටමින්  ව්‍යාපෘතියේ කාර්යයන් සිදුකිරීමට බලාපොරොත්තු වේ. රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් සිදුකළ කාර්යයන් සම්බන්ධ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගුවේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ඇගයීම් ලියවිල්ල අනුව, 2013-2017 සඳහා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම සඳහා ද්විතියික සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. පෙර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ  රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය පළාත් මට්ටමින් ව්‍යාපෘතිය  ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මන්දපෝෂණ හා බෝනොවන රෝග අභියෝගයන්ට හොඳින් ප්‍රතිචාර දැක්විය හැකිවන පරිදි මහජන සෞඛ්‍ය කාර්ය සාධන තත්වය ඉහල නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 කට සමාන විහැගු මිලියන 129.8 ක් වේ. ව්‍යාපෘතියේ කාර්යයන් 2013 ජුලි 01 වන විට ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට සම්පූර්ණ කිරීමට නියමිතය.

**1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------------------------**

පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් සංස්කරණය කිරීමෙන් මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම  කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය මුදල් රෙගුලාසි හා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ තෝරා ගැනීම සහ යොදා ගැනීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**----------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය  කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳ  සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. ඒකාබද්ධ මූල්‍ය  කළමනාකරණ

වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු මෙන්ම සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු සඳහා දරන ලද වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම් හා මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) මුදල් රෙගුලාසි 150 සහ 2013 දෙසැම්බර් 06 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 233/2013 ට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) අග්‍රිම අරමුදල් ගිණුමේ මූලික තැන්පතුව , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා ඌනපූර්ණය කිරීම් රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව සහ

(උ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ මුලික තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා ඌන පූර්ණය කිරීම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

ව්‍යාපෘතිය විසින් ලබාදුන් තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ සියලු ප්‍රභවයන්ගෙන් ලද අරමුදල් අතුරින් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු සඳහා දරන ලද වියදම්වල එකතුව රු. 34,734,406,629 ක් විය. 2013 වර්ෂය සඳහා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්වල ඉදිරිපත් කර ඇති ආකාරයට සියලු අරමුදල් ප්‍රභවයන්ගෙන් දරන ලද වියදම්වල සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| **විස්තරය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සියලුම ප්‍රභවයන්ගෙන් ලද අරමුදල් වලින් දරන ලද වියදම** |
|---|---|
| | **රු.** |
| පුනරාවර්තන වියදම් | 34.198,525,465 |
| මූලධන වියදම් | 535,881,164 |
| | 34,734.406,629 |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 100 කට සමාන එජඩො.769,230 ක් 2013 ජුලි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාලච්ඡේදය සඳහා ලැබිය යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනට ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් අරමුදල් ලැබී නොතිබුණි. ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව අනුව ශ්‍රී ලංකා රජය විසින් අයවැය ඇස්තමේන්තු මඟින් මූලධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා පිළිවෙලින් වෙන් කරන ලද එකතුව රු.35,098,808,601 හා රු.36,049,322,719 ක් අතුරින් මූලධන අරමුණු යටතේ රු.900,283,130 හා පුනරාවර්තන අරමුණු යටතේ රු.414,632,948 ක ශුද්ධ ඉතිරියක් පළාත් නවයෙන්ම වාර්තා විය. තවද, සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරන ලද මුළු ශුද්ධ වෙන් කිරීම්වලින් සියයට 9.5 කට වැඩි ශුද්ධ ඉතිරියක් සබරගමුව හා ඌව පළාත් වල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු වල පැවති බව නිරීක්ෂණ වූ අතර මුළු ශුද්ධ වෙන් කිරීම්වලින් සියයට 5 ට අඩු ශුද්ධ ඉතිරියක් අනෙක් පළාත් 06 න් වාර්තා විය. තවද, කරන ලද මුළු වෙන්

කිරීම් වලින් සියයට 1.2 ක් වූ රු.84,397,152 ක අතිරික්තයක් බස්නාහිර පළාතේ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් වාර්තා විය.

## 5.2 භෞතික කාර්යසාධනය

-----------------------

මෙම වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් කර ඇති ආකාරයට 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු අරමුදල්වලින් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු විසින් උපයෝජනය කරන ලද රු.34,734,406,629 ක් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ පෙන්නුම් කෙරේ. 2013 වර්ෂය සඳහා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත ආකාරයට නැවත ඉදිරිපත් කෙරේ.

(අ) හන්තාන මධ්‍යම බෙහෙත් ගබඩාව හා මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය රෝහල හා මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත සපයනු ලැබූ බෙහෙත් හා ශල්‍ය උපකරණ ප්‍රමිති තත්වයන්ට අනුකූල නොවූ බව විගණනයේදී අනාවරණය විය. තවද, දකුණු පළාතේ හික්කඩුව දිස්ත්‍රික් රෝහල වෙත සපයන ලද මිලිග්‍රෑම් 25 යූ.එස්.පී ප්‍රෝමෙතසීන් හයිඩ්‍රොක්ලෝරයිඩ් එන්නත් තුල සැකසහිත ද්‍රව්‍ය සොයාගනු ලැබීය.

(ආ) කුලියාපිටිය මූලික රෝහලේ ශල්‍යාගාර 04 ක් සහිත තට්ටු 07 ගොඩනැගිල්ල පොල්පිතිගම ග්‍රාමීය රෝහලේ ළමා වාට්ටුව හා නාවලපිටිය මූලික රෝහලේ X-කිරණ යන්ත්‍ර වසර 1 ½ කට වඩා වැඩි කාලයක් ඌණ උපයෝජිතව පවතින බව වාර්තා විය.

(ඇ) ඉහත කරුණුවලට අමතරව මධ්‍යම,දකුණ, උතුර හා නැගෙනහිර පළාත්වල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක නොමැති බව පිළිබඳ පොදු අදහස් දැක්වීම් සහ උතුරු මැද ,වයඹ, උතුර හා නැගෙනහිර පළාත්වල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු වල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම නොමැති බව අදාල පළාත් වල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල වාර්ෂික විසර්ජන ගිණුම් විගණනයේදී නිරීක්ෂණය විය. තවද,සමාලෝචිත වර්ෂය තුලදී අදාල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු විසින් සිදුකරන ලද කාර්යයන් නියමිත ලෙස සංවිධානය ,මෙහෙයවීම හා අධීක්ෂණය කර නොතිබූ බව දක්නට ලැබීය.